# අභිවාහ්‍ය කලා හා සන්නිවේදන අධ්‍යයන
# සහ මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා:
# අනාගතය පිළිබඳ ප්‍රයෝගික දැක්මක්

සසංක පෙරේරා

(කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ 25 වන සංවත්සර උත්සවයේ දී
2025 පෙබරවාරි 28 වනදා කළ විශේෂ දේශනය)

සියලු දෙනාගෙන්ම අවසරයි. සුභ උදෑසනක්.

කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලී මණ්ඩපය පිහිටුවා වසර 25 ගතවීම සමරණ මේ අවස්ථාවට මට ආරාධනා කිරීම පිළිබඳ මගේ ස්තූතිය. මෙවන් සංවත්සරයක් ආයතනයකට සහ එහි සාමාජිකයින්ට තමන්ගේ ගමන් මග, මග හැරුණු අවස්ථා සහ යා යුතු අනාගත දිශානති පිළිබඳව ආවර්ජනයක යෙදෙන්න සහ කේන්ද්‍රීය තීරණ ගන්න ඉතාමත් සුදුසු මොහොතක්. ඒ කර්තව්‍යය ඔබ සැම විසින් වැඩි කලක් නොයවා ප්‍රවේශමින් සිදු කරනු ඇතැයි යන්න මගේ බලාපොරොත්තුවයි.

මේ සංවත්සර මොහොත අද දින ඔබට ඉදිරිපත් කළ යුතු යැයි මා කල්පනා කළ මගේ සිතුවිලි ධාරාවේ ආරම්භය සේ ගෙන, මෙවන් ආයතනයක පුළුල් අනාගත දිශානති ගැන යම් කෙටි අදහස් දැක්වීමක නිරත වන්නයි මගේ අදහස.

මම තේරුම් අරන් තියෙන ආකාරයට, මේ අධ්‍යයන මණ්ඩපය පුළුල් ක්ෂේත්‍ර දෙකක් වෙත අවධානය යොමු කරනවා. ඒ තමයි අභිවාහ්‍ය කලා (performance arts) සහ සන්නිවේදන මාධ්‍යය (media). මේ දෙක සාම්ප්‍රදායික අර්ථයෙන් මානව ශාස්ත්‍ර (humanities) සහ සමාජයීය විද්‍යා (social sciences) යන පුළුල් ශික්ෂණ කුලක දෙකට අතුලත් කරන්න උත්සාහ ගත්තත්, එම උත්සාහය අතිශයින් අසාර්ථක සහ අසම්පූර්ණ බවයි මගේ විශ්වාසය.

ඒ කියන්නේ, අභිවාහ්‍ය කලා මානව ශාස්ත්‍ර කුලකයටත් සන්නිවේදන මාධ්‍යය සමාජයීය විද්‍යා කුලකයටත් අයත් යැයි සිතීම වර්තමානයේදී කළ නොහැකි හා අසාර්ථක ව්‍යායාමයක් බව මේ ක්ෂේත්‍ර දෙක තත්කාලීනව වර්ධනය වී ඇති ආකාරය දෙස බැලීමෙන් සහ අප ජීවත් වෙන ලෝකයේ ජීවන යථාවන් මේ ක්ෂේත්‍ර දෙක සමග සම්බන්ධ වී ඇති ආකාරය දෙස බැලීමෙන් පහසුවෙන් තේරුම් ගත හැකියි.

අද මට කතාකරන්න අවශ්‍ය කරුණු සඳහා ප්‍රධාන ප්‍රවේශය මේ යථාව සපයනවා. මේ පැහැදිලි තත්කාලීන තත්ත්වය තුල මට මතුකරන්න අවශ්‍ය අන් කරුණු වන්නේ, මෙවන් පුළුල් ක්ෂේත්‍ර සඳහා අන්තර්-විෂයික (inter-disciplinary) ප්‍රවේශයක ඇති කේන්ද්‍රීය වැදගත් කම, තාක්ෂණය සහ මේ පුළුල් විෂය කුලක අතර ඇතිකර ගත යුතු අනිවාර්ය සබඳතාවේ ස්වභාවය, අන්තර්-සම්න්ධිත ලොවකට සිසුන් පිවිසීමේදී ඊට අවශ්‍ය විෂය පුහුණුව හා කුශලතා ගෝලීය සහ දේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන ලබා දීමේ වැදගත්කම, විචාර පූර්වක චින්තන හැකියාවක අවශ්‍යතාව හා අචාරධර්මවල වැදගත්කම සහ ජාත්‍යන්තර සහයෝගීතා ජාලවල අවශ්‍යතාව.

මා මේ කරුණු මතුකරන්නේ වර්තමානය සහ අනාගතය ගැන සිතීමේදී සැලකිල්ලට ගත යුතු කේද්‍රීය අදහස් වශයෙන් මිසක්, අද දින ක්‍රියාත්මක කළ හැකි කඩිනම් අවසාන විසඳුම් වශයෙන් නොවේ. අවශ්‍ය නම්, ඒවා විසඳුම් බවට පත්කර ගත යුත්තේ ඔබ විසින්.

**අභිවාහ්‍ය කලා මානව ශාස්ත්‍ර ද සන්නිවේදන මාධ්‍යය සමාජයීය විද්‍යා ද?**

අභිවාහ්‍ය කලා සහ සන්නිවේදන මාධ්‍යය මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා කුලකවලට විචාරපූර්වක නොවී එක් කිරීම අප රටත් ඇතුළුව ලොව නොයෙකුත් අන් කලාපවලත් විසඳා නොගත් සංකල්පීය සහ ශික්ෂණ ශාස්ත්‍රමය (pedagogic) ගැටළුවක්. මෙය මේ විෂයන් දෙකේ ඉතිහාසයේ අතීත යුගවල අපහසුවක් නැතිව කළ හැකිව තිබූ දෙයක්. නමුත් අද එමගින් සිදුවෙන්නේ එම විෂය කේෂ්ත්‍ර තුල සිදු වී ඇති ඇති විශාල වර්ධන සහ පුළුල්වීම් අවධානයට ලක් නොවීමයි.

අභිවාහා කලා සහ සන්නිවේදන මාධ්‍යය යන විෂය ක්ෂේත්‍ර දෙස අවධානය යොමු කරමින්, අපි අපගෙන් ම ඇසිය යුත්තේ මෙවන් ප්‍රශ්නයකි: ඩිජිටල් තාක්ෂනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂනය, සිනමා වේදයේ තාක්ෂණික පැතිකඩ වැනි දේ වෙත අවධානය යොමු නොකර, මේ විෂයන් දෙක සම්බන්ධයෙන් අපිට සාර්ථක න්‍යායාගත කිරීම්, ප්‍රයෝජනවත් පුහුණුවක්, අනාගත රැකියාවලට සිසුන් සූදානම් කිරීම වැනි අත්‍යාවශ්‍ය දේ කල හැකිද?

මම මේ ප්‍රශ්න මතුකරන්නේ සහ අදහස් දක්වන්නේ, හුදෙක් මේ පුහුණුව ලබන තරුණ තරුණියන් ලංකාව තුල පමණක් සාර්ථක වෘත්තීය ජීවිතයක් ගත කරනු ඇතැයි යන පටු හා අතාර්කික පරිකල්පනයේ පිහිටා නොවේ. දැනටමත් අපගේ වැනි ජවසම්පන්න නොවූ සහ ප්‍රසාරණය නොවෙන ආර්ථිකයක, මෙරට අධ්‍යාපනය හා පුහුණුව ලබන සියළු දෙනා අනාගත ශ්‍රමිකයින් වශයෙන් ස්ථානගත කළ හැකි යයි සිතීම මුලාවකි. එනිසා, මා මේ ගැන කල්පනා කරන්නේ, සමස්ථ ලෝකයම විවර වී ඇති, එසේ නැත්නම් විවර කර ගත යුතු හා විවර කර ගත හැකි අවස්ථා පිළිබඳවත් සිතා බලමින්.

මගේ යෝජනාව වන්නේ, අපි මුලින්ම මේ විෂයන් ඒවා දැනට සිරගත වී ඇති පැරණි ශික්ෂණවේදී රාමුගත කිරීමෙන් මුදවා ගෙන, තත්කාලීන ලොවේ යථාවන් හා ඒ විෂයන්ගේ දැනට සිදු වී ඇති ප්‍රවර්ධනත් සැලකිල්ලට ගෙන, ඒවා පැහැදිලිවම හා විධිමත්ව අන්තර්-විෂයික ක්ෂේත්‍ර ලෙස හඳුනාගත යුතු බවයි.

මෙය බොහෝ සරල දෙයක් ලෙස පෙනී ගියත්, මම අදහස් කරන්නේ, අතිශයින් කේන්ද්‍රීය මූලධර්මීය විපර්යාසයක් පිළිබඳවයි. නමුත්, මෙවන් දෙයකට අවතීර්ණ වීමට නම් පැහැදිලි බුද්ධිමය නායකත්වයක් සහ චින්තනමය හැකියාවක් ආයතනයේ ඉහල ස්ථරවල සිට පහල ස්ථර දක්වාම තිබිය යුතුයි.

අන්තර්-විෂයික ක්ෂේත්‍ර ලෙස මේ විෂයන් විධිමත්ව හඳුනා ගත හොත්, එය හුදු සංකල්පීය හෝ මතුපිටින් කරන ලේබල් මාරු කිරීමේ වෙනසක් පමණක් නොවේ. එය වඩාත් වැදගත් වන්නේ, පරමාදර්ශීයව සහ ප්‍රායෝගිකව නම්, එමගින් අති විශාල ශික්ෂණවේදී වෙනස්කම් සලකුණු කරන නිසාය. මෙය හුදෙක් විෂයන් කීපයක් මතුපිටින් සම්මිශ්‍රණය කිරීමක් නොවේ.

එය මේ විෂය ධාරාවන්ට අත්‍යවශ්‍යය තාක්ෂණික පුහුණුවේ තෝරාගත් අංග ද ඇතුලත්ව දැනට උගන්වන විෂයන් කාලයට අවශ්‍ය ලෙසින් සංස්කරණයට සහ නව්‍යකරණයට ලක් කිරීමට අමතරව, ඒවාට අත්‍යාවශ්‍ය නව දැනුම හා ප්‍රවේශ එක්කළ හැකි, විචාර පූර්වකව සිතා බලා හඳුනාගත් නව විෂයන් ද ගෙන එන පුළුල් වෙනසකි.

මෙවන් වෙනසක් කරන්නේ නම්, එහිදී ලඟා කර ගත යුතු අනිවාර්ය අභිලාශ කිහිපයක් වේ. ඒවා මා දකින්නේ පහත සදහන් ලෙසිනි:

1) මෙවන් විෂය ක්ෂේත්‍රවලට විශ්වවිද්‍යාල ඔස්සේ පිවිසෙන සිසුන් ට ගෝලීය මට්ටමින් තරඟ කළ හැකි සංකල්පීය, න්‍යායික, විෂය මූලික හා තාක්ෂණික දැනුමක් ලබා දීමේ වැදගත්කම. මෙයින් මා අදහස් කරන්නේ, අප ලබා දෙන දැනුම යල් පැන ගොස් නැති, මේ ක්ෂේත්‍ර හා සම්බන්ධිත ලෝකයේ අන් ඕනෑම ආයතනයක ලබා දෙන දැනුමට සමාන විය යතු බවයි. දැනට සිදුවන්නේ මෙය දැයි ඔබ කල්පනා කර බැලිය යුතුයි.

   වෙනත් ලෙසකින් පවසන්නේ නම්, මේ ආයතනයෙන් ලොව මේ ක්ෂේත්‍ර හා සම්බන්ධ කේන්ද්‍රීය ආයතනයක වැඩිදුර අධ්‍යාපනයට, කෙටි කාලීන පුහුණුවකට හෝ ඉගැන්වීම වැනි කටයුත්තකට යමෙක් ගිය හොත්, ඔහු හෝ ඇය අතරමන් නොවිය යුතුයි. ඔවුන් මෝඩයින් සේ අන්‍යයන්ට පෙනී නොයා යුතුයි.

   අනෙක් අතට, මේ දැනුම දේශීය තත්ත්ව පිළිබඳ මැනවින් දැනුවත් වීමේ සිට දේශීයව නිපදවන, නමුත් ලොවට ගෙන යා හැකි මට්ටමේ ඇති දැනුමකින් ද සමන්විත විය යුතුය. මෙහිදී ලොවට ගෙන යෑමට සුදුසු ‘දේශීයව නිපදවන දැනුම’ වශයෙන් මා අදහස් කරන්නේ තාක්ෂණික දැනුම් මෙන්ම මේ ක්ෂේත්‍ර හා සම්බන්ධිත දාර්ශනික, සංකල්පීය, න්‍යායික යන චින්තනමය ආලෝකයයි. මේ

කොන්දේසි මේ ආයතනය විසින් මැනැවින් සපුරනවාද නැද්ද යන්න මට වඩා පැහැදිලිව දන්නේ ඔබය.

2) මෙසේ ලබා දෙන පුහුණුව සීමා සහිත වූ ලාංකේය රැකියා වෙළඳපොළ හා මෙරට බුද්ධිමය වපසරිය පමණක් සිහි තබාගෙන සැලසුම් නොකළ යුතුය. ඒ පුහුණුව අනාගතයේදී, අන්තර්-සම්බන්ධිත ලොවකට සිසුන් පිවිසීමේදී එහි ජීවත් වීමට සහ වෘත්තිකයින් වීමට අවශ්‍ය විෂය පුහුණුව හා කුශලතා ගෝලීය සහ දේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන ලබා දිය යුතුය.

   උදාහරණයකට, පරමාදර්ශීයව නම්, මෙවන් පුහුණුවකට තත්කාලීනව බලවත් ලෝක භාෂා වන ඉංග්‍රීසි, ප්‍රංශ, කොරියානු, චීන, ජපන් වැනි භාෂා පුහුණුවක් ද අතුලත් විය යුතුය.  මීට අමතරව, ගෝලීයව බලවත් නොවුවත්, ලාංකිකයින්ට වෘත්තීය සේවා ලබා  දිය හැකි හෝ රැකියා ලබාගත හැකි අන් රටවල භාෂා  ඉගෙන ගැනීමේ අවකාශ මේ වැඩසටහන් තුල තිබිය යුතුයි. මේවා අනිවාර්ය කරනවාට වඩා සිදු විය යුත්තේ, උන්නදුව ඇත්තවුන්ට ඉගෙනගැනීමේ අවකාශ සැලසීමය. මේවා අනාගත ලොවකට අවැසි කුශලතා සේ සැලකිය හැක.

   මෙවන් භාෂා වැදගත් වන්නේ, හුදෙක් තෝරාගත් දැනුම් පර්ශදවලට අතුලත් වීමේ මාර්ගවලට අමතරව, මෙරටින් භාහිරව රැකියා සඳහා අවකාස විවර කළ හැකි මෙවලම් ද වශයෙනි.

3) මේ ලබා දෙන දැනුම -- තත්කාලීන ආර්ථික සහ බුද්ධිමය යථාර්තයන්ට අනුකූලව -- තාක්ෂණයට සහ රැකියා ලබාගැනීමේ හැකියාවට බර විය යුතු වුවද, එමගින් මේ විෂයන්ගේ දාර්ශනික පසුබිම සහ විශේෂයෙන්ම විචාර පූර්වක චින්තන හැකියාවක අවශ්‍යතාව සහ අචාරධර්මවල වැදගත්කම ද අවධාරණය කළ යුතුය.

   මේවා නොමැතිව රටවැසියෙකු වීමට සහ ගෝලීය පුරවැසියෙක් වීමට අවශ්‍ය මූලික කොන්දේසි සපුරන්නේ නැත.  මෙය තමන්ටත්, රටටත්, ලොවටත් අහිතකර දෙයකි. එමෙන්ම, මෙවන් චින්තන සහ අචාරධර්මීය හැකියාවක් නැතිව, තමන්ගේ විෂය ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය බුද්ධිමය ජවය, කුතුහලය හා දිශානති සොයා ගැනීමේ හැකියාවද අඩාල කරන බව අපි තේරුම්ගත යුතුයි.

**ජාත්‍යන්තර සහයෝගීතා ජාලවල අවශ්‍යතාව[1]**

ඕනෑම විෂය ක්ෂේත්‍රයක දැනුම ගොඩනැගීම හා පුළුල් කිරීම මෙන්ම එම ක්ෂේත්‍රවල සිටින වෘත්තිකයින්ගේ  වෘත්තීය ජීවිත ගොඩනැගීමේදී වෘත්තීය සහයෝගිතාව (collaboration) මත පදනම් වූ ජාත්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති, අභ්‍යාස, පුහුණු වැඩ සටහන් හා ලිපි ලේඛන පලකිරීම අතිශයින් වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ශාස්ත්‍රාලයීය හා බුද්ධිමය ජාල සහ සංසද තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මේ යථාව මේ මණ්ඩපය අවධානය යොමු කරන පුළුල් ක්ෂේත්‍ර දෙක වන අභිවාහ්‍ය කලා සහ සන්නිවේදන මාධ්‍යය සම්බන්ධයෙන් ද එක සේ බලපායි.

නමුත් මේ සංසද, ව්‍යාපෘති, ජාල හා සබඳතා කෙතරම් වැදගත් වුවද ඒවා අතිශය ප්‍රවේශමෙන් ගොඩනඟා නඩත්තු කළ යුතුය. මෙහිදී සංසද හා  ව්‍යාපෘති යන පදවලින් මා පුළුල් වශයෙන් අදහස් කරන්නේ නොයෙකුත් සංවිධාන හෝ පුද්ගලයින් විසින් සංවිධානය කරන සම්මන්ත්‍රණ, පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘති සහ එවන් අන් බුද්ධිමය හා කතිකාමය අවකාශයන්ය.

එමෙන්ම ජාල සහ සබදතා යනුවෙන් මා  අදහස් කරන්නේ, මෙම සම්මන්ත්‍රණ සහ සමුළු වැනි වැඩසටහන්වලට කාලයක් මුළුල්ලේ සහභාගී වීම මගින් ගොඩනැගෙන දේශීය හා ගෝලීය ආයතනික සහ පෞද්ගලික සම්බන්ධතාවන්ය.

1. Most material presented here are taken from the keynote address titled, ‘Situating Social Sciences and Humanities in Sri Lanka  in the 21st Century’  delivered via Zoom at the ‘Ruhuna University International Conference on Humanities and Social Sciences 2020’ on 5 November 2020 at University of Ruhuna, Matara, Sri Lanka.

මැනවින් සිතා බලා ගැඹුරු ලෙසින් සංවිධානය කරන සම්මන්ත්‍රණවල බුද්ධිමය ප්‍රතිඵල වෙත සංවේදී හා බුද්ධිමත් සංවිධායකයින් දැඩි අවධානයක් යොමු කරන අතර, මේවාට සාමාන්‍යයෙන් විශාල පිරිසක් සම්බන්ධ නොවේ. දැනට ගෝලීය වශයෙන් වඩාත් ගැඹුරු හා පුළුල් සංවාදයනට ඉඩ සලසන සම්මන්ත්‍රණ ආකෘතිය ලෙස පිළිගන්නේ තේමාමය වශයෙන් වඩාත් සීමා වූ සහ වඩාත් අඩු හා තෝරාගත් පිරිසක් සහභාගී වන සම්මන්ත්‍රණ වේ. මගේ විශ්වාශය වන්නේත්, මෙවන් සම්මන්ත්‍රණ බුද්ධි සම්පාදනයට හා ඥාන නව්‍යකරණයට වඩාත් හිතකර බවයි. එනමුත් මෙය ලංකාව ද ඇතුළුව අන් බොහෝ රටවල භාවිතයට ගන්නා සම්මන්ත්‍රණ ආකෘතිය නොවේ.

මේ වෙනුවට අපේ රටේ සහ මේ සමස්ථ කලාපයේ මෙන්ම ලොව අන් බොහෝ රටවල ද වැඩි වශයෙන් සිදුවන්නේ මහා පිරිසක් සහභාගී කරගෙන තේමා අති විශාල ප්‍රමාණයක් මතුපිටින් පමණක් ආවරණය කරමින් පවත්වන පර්යේෂණ සැණකෙළිය. මේවා මගින් ගැඹුරු බුද්ධි කලම්බනයක් හෝ මා යෝජනා කරන ආකාරයේ සම්බන්ධතා ජාල හෝ සංසද ගොඩනගා ගත නොහැක. මේ පිළිබඳ සැකිල්ලක් නොදැක්වුව හොත් සිදු වන්නේ, පැහැදිලිවම අවර ගණයේ සම්බන්ධතා ජාල ගොඩ නගා ගෙන බෙහෙවින් පසුගාමී පර්යේෂණවල නියුතු වීම සහ එමගින් ගොඩනගන බුද්ධිමය වාතාවරණය අනිවාර්යයෙන් පසුගාමී වීමය.

මේ සම්බන්ධයෙන් මා නිරන්තරව අසන ප්‍රශ්නයක් වන්නේ, කාලයත් සමඟ අපගේ ශාස්ත්‍රාලයීය සගයන් විසින් ගොඩනගන සම්බන්ධතා ජාල කුමන ස්වභාවයක් ගනීද යන්නය. තත්කාලීනව අපගේ ශාස්ත්‍රඥයන් විදේශයන්හි හෝ දේශීයව සංචාරය කරන විට, ඔවුන් සම්මන්ත්‍රණ සඳහා සහභාගීවන ස්ථාන හෝ පසුව ඒ ඔස්සේ ඔවුන් ගොඩනගා ගන්නා සබඳතා ජාල ප්‍රවේශමෙන් තෝරා ගන්නා බවක් මට නොපෙනේ.

ඒ වෙනුවට, මා දකින දෙය මෙයයි: මේ වන විට අපේ ශාස්ත්‍රඥයන්ගේ ජාත්‍යන්තර සංචලනය බෙහෙවින් ඉහළ ගොස් ඇති වුවත්, මෙවන් ඇතැම් ගමන් සඳහා රාජ්‍යය අරමුදල් පවා ලැබුණත්, මෙවන් පහසුකම් යොදාගනිමින් තරුණ මෙන්ම ඇතැම් ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍රඥයන් ද බොහෝ විට ඉන්දියාවේ, පාකිස්තානයේ, බංග්ලාදේශයේ හා ඇතැම් විට යුරෝපයේ හා අග්නිදිග ආසියාවේ මා දන්නා සම්මන්ත්‍රණවලට බොහෝ විට පැමිණේ.

එනමුත් එම රටවලම සිටින කීර්තිමත් ශාස්ත්‍රඥයන් එම සම්මන්ත්‍රණවලට කිසිවිටෙකත් සහභාගි වන්නේ නැත. එවන් සබඳතා ජාලවල ඔවුන් සාමාජිකයන් වන්නේත් නැත. එයට හේතුව ඔවුන් මෙවන් සම්මන්ත්‍රණ අවර ගණයේ කටයුතු ලෙස සලකා, ඒවා බැහැර කරන බැවිනි.

මෙය වෙනත් ආකාරයකින් පවසන්නේ නම්, මෙම රටවලම සංවිධානය කරන බුද්ධිමය වශයෙන් වඩාත් තීව්‍ර සම්මන්ත්‍රණවලට මා මේ සඳහන් කළ ලාංකේය ශාස්ත්‍රඥයන් පැමිණෙන්නේ නැත. ඔවුනට ඒවාට ආරාධනා ලැබෙන්නේ ද නැත. එහි ඍජු ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන් වඩාත් ක්‍රියාශීලී බුද්ධිමය සම්බන්ධතා ජාලවල කොටස්කරුවන් වන්නේ නැත. ඒ වෙනුවට සිදුවන්නේ, ඔවුන් බුද්ධිමය වශයෙන් බෙහෙවින් පසුගාමී සම්බන්ධතා ජාලවල කොටස්කරුවන් බවට පත්වීමය.

එවැනි අවර ගණයේ ජාලයන්හි කොටසකරුවන් වීම සහ බුද්ධිමය වශයෙන් අභියෝගාත්මක නොවන සරල ශාස්ත්‍රීය සංවාදවලට සහභාගී වීම මගින් අප රටේ සමාජයීය විද්‍යාවන්ගේ හා මානව ශාස්ත්‍රවල බුද්ධිමය තීව්‍රත්වය ගොඩනැගීමට හෝ එක් එක් විද්වතුන්ගේ පුද්ගලික වෘත්තීය දියුණුව ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ උපකාරී වන්නේ නැත. එමගින් ඔවුන් ගේ සිසුන්ට බුද්ධිමය වශයෙන් වර්ධනය වීමට අවශ්‍ය දැනුම, දියුණු සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති හෝ පුහුණු වැඩසටහන් ලැබෙන්නේ නැත.

එනිසා අප තේරුම් ගත යුත්තේ, මෙවන් සබඳතා ජාලවල කොටස්කරුවන් වීම හෝ මෙවැනි සරල සම්මන්ත්‍රණවලට සහභාගී වීම මගින් අදාළ විෂයන්ගේ දැනුම කිසි ලෙසකින් හෝ ප්‍රවර්ධනය නොවන බවයි. මෙම මණ්ඩපය අවධානය යොමු කරන විෂය ක්ෂේත්‍ර දෙක සම්බන්ධයෙන් මෙවන් කරුණු සැකිල්ලට ගන්නේද යන්න මා දන්නේ නැත.

කෙසේ නමුත්, මේ සියල්ලම සිදු කළ හැක්කේ, හෝ එසේ කළ නොහැකි වන්නේ අප රටේ වර්තමානයේ මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පවත්නා තත්ත්වය මත සහ ආයතනය තුල පවතින බුද්ධිමය

වාතාවරණයේ ස්වභාවය හා උනන්දුව මතය. ලොව අන් බොහෝ කලාපවල මෙන්ම සමස්ථ දකුණු ආසියානු කලාපයේ ද මේ පුළුල් විෂය කුලක පවතින්නේ අතිශයින් දුර්වල තත්ත්වයකය. අපගේ අවධානය යොමුවිය යුතු කාරණය මෙයයි: ජාතික සමාජ-දේශපාලන සන්දර්භවල සාමූහික හෘදය සාක්ෂිය හා චින්තනය සමග 1970 ගණන් පමණ වන තුරු සමීපව සම්බන්ධ වී තිබුණු සමාජයීය විද්‍යාවන් හා මානව ශාස්ත්‍රවල කේන්ද්‍රීය භාවය පසුගිය දශක කිහිපය තුළ දැඩි අවතක්සේරුවකට හා නොසලකා හැරීමකට ලක් වී ඇත්තේ කුමක් නිසාද?

මගේ විශ්වාශය නම්, මෙය බොහෝ දුරට සිදුවී ඇත්තේ අන්තර්-සම්බන්ධිත හේතු දෙකක් නිසා බවයි. මේ කාරණා ද්විත්වය මා මීට පෙර 2017[2] දී කොළඹ පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුග්‍රහයෙන් සංවිධානය කළ සමුළුවකදී ඉදිරිපත් කරන ලදී. ඒ හා සම්බන්ධ කේන්ද්‍රීය කොන්දේසි තවමත් වෙනස් වී නැති නිසා, මේ කරුණු දෙක නැවත වරක් මෙහිදී ඉදිරිපත් කරන්නට මා කැමතියි:

1) පළමුව, සමාජයීය විද්‍යා හා මානව ශාස්ත්‍රයන්ට අයත් බොහෝ විෂයයන් — ආර්ථික විද්‍යාව හැර — උසස් අධ්‍යාපනය පිළිබඳ තීරණ ගන්නා රාජ්‍ය නිලධාරීන්, දේශපාලන නායකයින් මෙන්ම සාමාන්‍ය ජනතාව විසින් අධ්‍යාපන ධූරාවලියේ පහළ ස්ථරයට පිටුවහල් කර ඇත. ඒ අදාළ නොවන 'මෘදු' විෂය ලෙස ඒවා හංවඩු ගසමිනි. *'ඉල්ලුමක් ඇති' විෂයයන් කෙරෙහි පමණක් උනන්දුවක් දැක්විය යුතු යැයි ජනාධිපති* ගෝඨාභය රාජපක්ෂ මහතා කලකට ඉහතදී තරුණ සිසුන්ට පිරිසකට දුන් උපදෙස් අපට තේරුම් ගත හැක්කේ මෙම සන්දර්භය තුළ ය. ඔහුගේ මනසෙහි, 'ඉල්ලුමක් නැති විෂයයන්' ලෙස විද්‍යමාන වූයේ පැහැදිලිවම සමාජයීය විද්‍යාවන් හා මානව ශාස්ත්‍ර බව අපට තේරුම් ගත හැක.

නමුත් මෙය හුදෙක් දේශීය කොන්දේසියක් පමණක් නොවේ. එය පුළුල් ගෝලීය තත්වයකි. නිදසුනක් වශයෙන්, 2020 ජූනි මාසයේදී ඕස්ට්‍රේලියානු අධ්‍යාපන අමාත්‍ය ඩෑන් ටෙහාන් පැවසුවේ, විශ්වවිද්‍යාලවල මානව ශාස්ත්‍ර විෂයන් හදාරණ සිසුන්ගේ ගාස්තු *113% කින් වැඩි කළ යුතු බවයි.* මීට සාපේක්ෂව ඉංජිනේරු, කෘෂිකාර්මික, හෙද විද්‍යාව වැනි වඩාත් ප්‍රයෝජනවත් ලෙස සැලකෙන විෂයන් සඳහා ගෙවිය යුතු ගාස්තු බෙහෙවින් අඩු වීය. ඔහු කියා සිටියේ මෙම තීරණය ගත්තේ, උසස් අධ්‍යාපනයේදී රැකියා හා සෘජුව සම්බන්ධ විෂයන් තෝරාගැනීමට සිසුන්ට දිරිගැන්වීමට බවයි.

වෙනත් වචන වලින් කිවහොත්, ඔහුගේ උනන්දුව වූයේ ඕස්ට්‍රේලියාවේ තරුණයින් පොදුවේ මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යාවන්ගෙන් ඈත් කිරීමයි. නමුත් බොහෝ රටවල, ආර්ථික විද්‍යාව මෙම තත්වයෙන් ගැලවී ඇත්තේ එය ඊනියා 'සංවර්ධනය' සමග සෘජුවම සම්බන්ධ වී තිබීම නිසා ය. යම් තාක් දුරට අපගේ වැනි රටවල සමාජ විද්‍යාව (sociology) හුදෙක් දත්ත එක්රැස් කිරීමේ භාවිත ලෙස ප්‍රතිනිර්මාණය කර ඇත්තේ ඉතාමත් දුර්වල ලෙස ආර්ථික විද්‍යාවේ ඇතැම් ශිල්ප ක්‍රම අනුකරණය කිරීමෙනි.

2) දෙවනුව, සමාජයීය විද්‍යා හා මානව ශාස්ත්‍ර සමග ගණුදෙනු කරන අපගේ බොහෝ ශාස්ත්‍රඥයන් ජනප්‍රියව පවතින මෙම නිශේධනීය විශ්වාසය නිෂ්ප්‍රභා කිරීමේ අභිප්‍රායයක් හෝ හැකියාවක් ඔවුන්ගේම පර්යේෂණ, බුද්ධිමය මැදිහත්වීම්, ප්‍රකාශන සහ සමාජ මැදිහත්වීම් ප්‍රගුණ කිරීම මගින් පෙන්වා දී නැත. මා ඉහත සඳහන් කළ සම්බන්ධතා ජාල, පර්ෂද සහ සහයෝගීතා පර්යේෂන ආදිය වඩාත් වැදගත් වන්නේ මේ සන්දර්භය තුලය.

මෙම තත්වය තුළ, මෙම විෂයන් මුහුණ දී ඇති අර්බුදය සහ ගරාවැටීම ඔවුන් විසින්ම යථාවක් බවට පත් කර ඇත. මේ පුළුල් තත්ත්වය පර්යේෂණ සඳහා අප තෝරා ගන්නා තේමා මෙන්ම අපගේ විෂය මාලාවන්ගේ සැලසුම්, ඉගැන්වීම පිළිබඳ මූලික ප්‍රවේශ සහ පාඨමාලා සඳහා කේන්ද්‍රීය කියවීම් තෝරා ගැනීම යන කරුණු කෙරෙහි සෘණාත්මක ලෙස බලපා ඇත.

2. Most material in this section are taken from the keynote address titled, 'Reclaiming Social Sciences and Humanities: Notes from South Asia' delivered at the 4th Annual Research Symposium of National Centre for Advanced Studies (NCAS) in Social Sciences and Humanities, Colombo, Sri Lanka on December 20th 2017.

මට පෙනෙන පරිදි, අපි තවදුරටත් බුද්ධිමය අවදානම් හෝ ශාස්ත්‍රීය වික්‍රමයන් සිදු නොකරන්නෙමු. මෙවන් ඉදිරිගාමී හා නිර්මාණශීලි ප්‍රවේශ භාවිත නොකර කිසිම කලාවක් හෝ විද්‍යාවක් දියුණු වනු ඇතියි සිතීම මුලාවකි. අවාසනාවකට මෙන්, අප අතර සිටින බොහෝ දෙනා මෙම අතිශය ගැටළුකාරී තත්ත්වය කිසි විටකත් සැලකිල්ලට නොගන්නා බව පෙනේ.

අප රටේ සමාජයීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර සම්බන්ධයෙන් බලපවත්වන මේ සාමන්‍යය තත්ත්වය මේ මණ්ඩපය අවධානය යොමුකරන අභිවාහ්‍ය කලා සහ සන්නිවේදන මාධ්‍යය වෙත මෙලෙසින්ම බලපානවාද, එසේ නොවන්නේ ද යන්න තේරුම්ගත හැක්කේ විචාර පූර්වකව තමන්ගේ විශයන් හා ඒවා තුල තම තමන්ගේ ඒක පුද්ගල භූමිකාවල ස්වභාවය ගවේෂණය කිරීමෙන් පමණි.

මා මුලින්ම ඉදරිපත් කළ ශික්ෂණවේදීමය සහ වඩාත් දියුණු ගෝලීය භාවිතවලට සමීප විය හැකි ආකාරයෙන් අභිවාහ්‍ය කලා, සන්නිවේදන මාධ්‍යය සහ මේවා හා අනුබද්ධ අන් සියළුම විෂයන් දියුණු කර ගත හැකි වන්නේ මේ පවතින ගැටළුකාරී තත්ත්ව මැනැවින් තේරුම්ගෙන, ඒවා වෙනස් කළ නොහැකි නම්, ඒවා අතික්‍රමණය කළ හැකි අන් ආකාර සොයා ගැනීමෙන් පමණි.

එවන් මාර්ග ආයතනික වශයෙන් සොයා ගැනීම අසීරු නම්, ඒවා පුද්ගලිකව හෝ ආයතනයෙන් භාහිර සාමූහික ව්‍යායාම වශයෙන් හෝ සාක්ෂාත් කර ගැනීම අතිශයින් වැදගත් වේ. නො එසේ නම් සිදු වන්නේ, තම තමන්ගේ වැඩ කටයුතු තමන්ටත්, තමන් විසින් පුහුණු කරනවා යැයි කියන සිසුන්ටත්, රටටත් කිසිදු ප්‍රයෝජනයක් නැති වීමය.

මා මෙතෙක් උත්සාහ කළේ ශ්‍රීපාලී මණ්ඩපයේ 25 වන සංවත්සරය සමරණ මේ මොහොතේ, ඔබගේ විෂය ක්ෂේත්‍රවල බුද්ධිමය වපසරිය, ඒවායේ ප්‍රායෝගිකත්වය සහ සේවා නියුක්තිකත්වය පුළුල්කර ගැනීමට අවශ්‍ය නම්, ඇසිය යුතු කේන්ද්‍රීය ප්‍රශ්න සහ ගවේෂණය කළ යුතු දිශානති කිහිපයක් ඔබ ඉදිරියේ තැබීමටයි. මා එය කළේ, ඔබගේ විෂය ක්ෂේත්‍රවලටත්, ඔබගේ ආයතනයටත්, මේ වන විට මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයටත් බෙහෙවින් පිටස්තර පුද්ගලයෙකු වශයෙනි.

නමුත් ඇතැම් විට, ඒ පිටස්තර කම, යම් කරුණු දෙස වඩාත් විවෘතව සහ අභිනතීන්ගේ ගිලී නොගොස් බැලීමට අවස්ථා ලබා දෙයි. අනෙක් අතට, මේ වන විටත් මා අද මතු කළ ප්‍රශ්න ඔබ විසින් දැනටමත් මතුකර, ඒවාට විසඳුම් ලබා දී තිබෙන්නටත් පුළුවනි.  නැති නම්, ඒ විසඳුම් සැලසුම් කරමින් සිටිනවා විය හැකියි. නොඑසේ නම්, මේවා ගැටළු නොවේ යැයි, නැති නම්, තමන්ට අදාළ නොවේ යැයි ඔබ තීරණය කර ඇති. මේ පිළිබඳ පවතින යථාව කුමක්දැයි මා දන්නේ නැත.

කෙසේ නමුත්, මේ පිළිබඳ ඔබ දැනට අවධානය යොමුකර නැත්නම් සහ විචාරපූර්වක අදහස්වලට විවරවීමේ හැකියාව ඔබට තිබේ නම්, එසේ කරන ලෙස මා ඔබගෙන් ඉල්ලා සිටිනවා. එවිට ඔබ ඔබගේ ඊළඟ සංවත්සරය සමරණ අවස්ථාවේදී ඔබ ලොවට දායාද කර ඇති විෂය දැනුම; සංකල්පීය ප්‍රවර්ග සහ න්‍යායික ප්‍රවේශ; පර්යේෂණ විධික්‍රම සහ ශිල්ප ක්‍රම සහ ලොව නොයෙක් ප්‍රදේශවල ඇති ආයතනවල සේවයට යවා ඇති වෘත්තිකයින්ගේ තත්ත්වය පිළිබඳව ඔබට සැබැවින්ම සතුටු විය හැකියි.

ඔබ සැමට සුබ උදෑසනක්; ඔබ සැමට සුබ අනාගතයක්.